**අභ්‍යන්තර විභාග නිවේදනයයි**

මගේ අංකය: PPSC/EX/1/3/1/2023
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2022.12.30

පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
වයඹ පළාත.

**වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2023**

වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය **2023** පෙබරවාරි මාසය තුළ කුරුණෑගලදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා I වන ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් ව්‍යුහගත පරීක්ෂණය සඳහා අයදුම් කළ හැක.

02. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍ර නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරගත යුතු අතර එම අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2023.01.25** දින හෝ එදිනට පෙර **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ සම්මුඛ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

03. **අයදුම්පත්‍රය :-** ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

04. **විභාග ගාස්තු :-** පළමුවරට මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන් පසු වාරවලදී නිලධාරියෙකු විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින්නේ නම් රු. 500/- ක්ද, විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෝ සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු.- 02 ආකෘතියෙන් ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට හෝ සම්මුඛ පරීක්ෂණයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. **අනන්‍යතාව :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කවරක් වුවද පිළිගත හැකිය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ( පාස්පෝට් බලපත්‍රය )

06. **විභාග ප්‍රවේශපත්‍ර** :- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, **ඔවුන් තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail address) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් තම ප්‍රවේශපත්‍රය භාගත කර ගත යුතු අතර, එලෙස ප්‍රවේශපත්‍රය භාගත කර ගත නොහැකි අයදුම්කරුවන් වෙතොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.**

එලෙස අයදුම්කරුවන් වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රවේශපත්‍ර යොමු කළ වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළකරන අතර, ඒ බව අදාළ දෙපාර්තමේන්තු වෙතද ලිඛිතව දැනුම් දෙනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරුවන්ට ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

**සැළකිය යුතුයි -:**

**අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රවේශපත්‍රය යොමු කරන බැවින්, එය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කිරීම අනිවාර්යය වේ.**

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට කාර්යක්ෂමතා පරීක්ෂණය සඳහා පෙනී සිටින නිලධාරීන්ට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය අතර ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

08. **විභාග පටිපාටිය** :-
පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලබා ඇති සහතිකවලට ලකුණු ලබා දෙනු ලැබේ. උපරිම ලකුණු 100 කි. සමත් වීම සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | වෘත්තීය සුදුසුකම් -<br>රජයේ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් ( NVQ 5 මට්ටම) | 15 | 40% |
| 2 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>රජයේ පිළිගත් ආයතනයක මාස 06 ක්/ අවුරුද්දක ඩිප්ලෝමා පාඨමාලාවක් (NVQ 5 මට්ටම)<br>- මැහුම් පිළිබඳ දැනුම<br>- රූපලාවන්‍ය පිළිබඳ දැනුම<br>- ආහාර තාක්ෂණය පිළිබඳ දැනුම | 25 | |
| 3 | විශේෂ කුසලතා<br>විශේෂ වැඩසටහන්/ ප්‍රදර්ශන ( I පන්තියට පැමිණි පසු විශේෂ වැඩසටහන් 03කට සහභාගී වීම )<br>- රාජ්‍ය සේවයේ කටයුතු සඳහා දක්වන සහයෝගය<br>- ප්‍රශංසා ලිපි - උපරිම ලිපි 05යි ( ලකුණු 05 බැගින්)<br>- කාර්ය සාධනය<br>- ඉතා හොඳයි/ හොඳයි/ සතුටුදායකයි<br>5 3 2 | 10<br>25<br>25 | |

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ඇත.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.බී. වික්‍රමසිංහ,  
ලේකම්,  
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයැදුම්පත්‍රය

**<u>වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2023</u>**

01.1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්) :- ..........................................................................
මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :- ..........................................................................

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ..........................................................
..........................................................................................................................

1.4 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :- ..........................................................................
..........................................................................................................................

**(මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ.)**

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

1.6 උපන් දිනය :- අවුරුද්ද | | | | | මාසය | | | දිනය | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :-

2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම :- ............................................
..........................................................................................................................

2.2 රාජකාරි ලිපිනය :- ..........................................................................................
..........................................................................................................................

2.3 දුරකතන අංකය :- රාජකාරී : ..............................................
පෞද්ගලික : ..............................................

03. දැනට දරණ තනතුර :-

3.1 තනතුර :...........................................................................................

3.2 ශ්‍රේණිය : ...........................................................................................

3.3 ඉහත ශ්‍රේණියට පත්වූ දිනය :...........................................................

04. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :- [ ]
(සිංහල - S , දෙමළ - T , ඉංග්‍රීසි - E )
(අදාළ අක්ෂරය කොටුව තුල ලියන්න)

05. ඔබ විභාගයට ඉල්ලුම් කරන විෂයයන් :- (සම්මුඛ පරීක්ෂණයේ නම සඳහන් කරන්න.)

I. ..........................................................................

06. ඔබ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ?
.........................................

6.1 එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,

කුවිතාන්සි අංකය :- ........................................... මුදල :- ....................................
දිනය :- ......................................................
නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..............................................................

| |
|---|
| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

07. අයැදුම්කරුගේ සහතිකය :-

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පනවා ඇති නීති රීති පිළිපැදීමටද එකඟ වන අතර මා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරිනියක බවද සහතික කරමි.

........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය:- ....................................

08. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

I. ඉහත විස්තර සඳහන් …………………..........………………….........……… නැමැති මෙම නිලධාරියා/ නිලධාරිනිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරිනියක බවද,
II. ඔහු/ඇය මැහුම් උපදේශිකා ............. ශ්‍රේණියේ නිලධාරිනියක බවද, මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවද,
III. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද/ පළමු වතාවට නොවන බවද, නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති/ නැති බවද,
IV. අයදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට හිමිකම ඇති බවද,
V. ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද,

සහතික කරමි.

(අදාළ නොවන වචන කපා හරින්න)

……………….....……………………
ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :………………………………………………….
ලිපිනය :……………………………………………….....
දිනය :………………………………………………….